එල්ගල්ලේ සුජාත හිමි,
සුමනාරාමය,
හන්දකැටිය,
බදුලුඹය.

2024.09.14

EDR

සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ ලේකම් කාර්යයාලය,
සරණ පාර,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>ජනාධිපතිවරණ පනතේ ප්‍රතිපාදන උල්ලංඝණය කරමින් ජනාධිපතිවරයා විසින් නෙළුම් කුළුණ පරිශ්‍රය ඇතුළත පවත්වාගෙන යාම සඳහා කැසිනෝ බලපත්‍රයක් නිකුත් කිරීම සම්බන්ධයෙනි</u>

1. මා වෙත කරුණු අනාවරණය වී ඇති ආකාරයට ජනාධිපතිවරණ මැතිවරණය ප්‍රකාශයට පත් වී ඇති අවස්ථාවේ දී ජනාධිපතිවරයා විසින් මුදල් ඇමතිවරයා ලෙස සිය බලතල භාවිතා කරමින්, කොළඹ නෙළුම් කුළුණ ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යාම සඳහා ඉන්දියානු සමාගමකට කැසිනෝ බලපත්‍රයක් නිකුත් කර ඇත.

2. මා වෙත අනාවරණය වී ඇති කරුණු අනුව, 2010 අංක 17 දරණ කැසිනෝ ව්‍යාපාර (නියාමනය) පනතෙහි ප්‍රතිපාදන සහ එම පනත යටතේ නිකුත් කර ඇති 2022 අංක 01 දරණ කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීමේ රෙගුලාසි යටතේ ලබා දී ඇති බලය අවභාවිතා කරමින් ඉන්දියානු සමාගමක් වන Golden Island Hospitality Private Limited සමාගම විසින් පවත්වාගෙන යන Majestic Pride Casino Sri Lanka යන නමින් ඉතා මෑතක දී ලියාපදිංචි කර ඇති ව්‍යාපාරයක් වෙත නව කැසිනෝ බලපත්‍රයක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

3. මා වෙත හෙළි වී ඇති කරුණු අනුව, 2024.01.12 දින සංශෝධනය කරන ලද 2022 අංක 01 දරණ කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීමේ රෙගුලාසිවල 5 වන රෙගුලාසියේ ප්‍රතිපාදන අනුව, ඇමරිකානු ඩොලර් මිලියන 250 ක ආයෝජනයක්

මෙරට තුළ සිදු කරනු ලබන සමාගමක් වෙත රුපියල් බිලියන 10 ක බලපත්‍ර ගාස්තුවකට යටත්ව කැසිනෝ ව්‍යාපාර බලපත්‍රයක් නිකුත් කිරීමේ හැකියාව පවතියි.

4. මා වෙත කරුණු හෙළිදරව් වී ඇති ආකාරයට, විනිවිදභාවයකින් යුතු ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව ඉහත කී ඉන්දියානු සමාගම වෙත කැසිනෝ බලපත්‍රයක් නිකුත් කිරීමට ජනාධිපතිවරයා කටයුතු කර ඇති අතර එම සමාගම සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අතර ඇති කරගත් බව පැවසෙන ඊනියා ගිවිසුම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17(2) වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ, 2024.08.01 දින වේ.

5. ඒ අනුව, ඉහත කී ලියාපදිංචි වීම, ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සිදු වී ඇත.

6. එසේ නමුත්, එලෙස ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමක් ලියාපදිංචි වීමට පෙර දිනයක් වන 2024.07.05 දින ඉහත කී Golden Island Hospitality Private Limited සමාගම විසින් පවත්වාගෙන යන Majestic Pride Casino Sri Lanka යන කැසිනෝ ව්‍යාපාරය සඳහා 2024.07.05 දින 2010 අංක 17 දරණ කැසිනෝ ව්‍යාපාර (නියාමනය) පනතෙහි ප්‍රතිපාදන යටතේ ඊනියා බලපත්‍රයක් නිකුත් කිරීමට ජනාධිපතිවරයා විසින් කටයුතු කර ඇත.

7. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පොලිස්පති ධූරයේ රාජකාරි කරමින් සිටි දේශබන්ධු තෙන්නකෝන් මහතාගේ සේවය අත්හිටුවීමෙන් පසුව, වැඩබලන පොලිස්පතිවරයෙකු පත් කිරීමට ජනාධිපතිවරයාට හැකි බවට දක්වා තිබිය දී පවා, ජනාධිපතිවරයා විසින් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයට අවනත නොවෙමින් වැඩබලන පොලිස්පතිවරයෙකු පත් නොකර සිටියේ, එමගින් ඔහු මැතිවරණ පෙත්සමකට වගඋත්තරකරුවෙනු වීමට හැකියාවක් ඇති බවට දක්වමිනි.

8. එසේ තිබිය දී, ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් වීමෙන් පසුව නිසි ක්‍රමවේදය අනුගමනය කිරීමකින් තොරව සහ විනිවිදභාවයකින් තොරව ඉතා විශාල ගනුදෙනුවක් වන කැසිනෝ ව්‍යාපාරයකට නව බලපත්‍රයක් නිකුත් කිරීම ජනාධිපතිවරයා විසින් ජනාධිපතිවරණය ප්‍රකාශයට පත් වීමෙන් පසුව සිදු කර ඇත.

9. ඒ අනුව, ජනාධිපතිවරයා පත් කර ගැනීමට අදාළ විධිවිධාන ඇතුළත් 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ දක්වා ඇති දූෂිත ක්‍රියා

ගණයෙහි කටයුත්තක් ජනාධිපතිවරයා විසින් සිදු කර ඇති බවත්, ඒ අනුව, මෙම කරුණ සම්බන්ධයෙන් මැදිහත් වී ඒ පිළිබඳ කරුණු මැතිවරණ කොමිසම වෙත වාර්තා කරන ලෙස මුදල් අමාත්‍යාංශය වෙත නියෝගයක් නිකුත් කරන ලෙසත්, ඉහත කී කරුණු අනුව 1981 අංක 15 දරණ ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මෙම කැසිනෝ බලපත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් මෙයින් ඉල්ලා සිටිමි.

ස්තූතියි.

මෙයට විශ්වාසී,

